රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2001

මගේ අංකය :- අ/1අ/1/26
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2001.08.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

<u>**රාජ්‍ය සේවයේ ස්ථාන මාරු පිළිබඳ ප්‍රතිපත්තිය**</u>

දීප ව්‍යාප්ත සේවා , ඒකාබද්ධ සේවා , පළාත් රාජ්‍ය සේවා සහ දෙපාර්තමේන්තුමය සේවා යන සේවාවන්හි නිලධාරීන්ගේ ස්ථාන මාරු පිළිබඳ පොදු ප්‍රතිපත්තියක් තිබිය යුතු බව රජය තීරණය කර ඇත. ඒ අනුව උපරිම කාල සීමාව වන අවුරුදු 05 ක් එකම තනතුරේ/සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් තනතුරුවල/සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ දීම සඳහා වහාම ස්ථාන මාරු ලබා දිය යුතුව ඇත.

02. සමහර සේවාවන්/දෙපාර්තමේන්තු/පළාත් සභා ආදී ආයතන තමන් යටතේ සේවය කරන නිලධාරීන් සම්බන්ධයෙන් ස්ථාන මාරු කිරීමේ ක්‍රම දැනටමත් ක්‍රියාත්මක කරන බව නිරීක්ෂණය කෙරේ. මේ අවස්ථාවේදී එවැනි ස්ථාන මාරු ක්‍රමවල සංශෝධනයක් කිරීමට අදහස් නොකෙරේ. කෙසේ වුවත් මුලික පියවරක් වශයෙන් රජය විසින් දැනට ගෙන ඇති ස්ථාන මාරු පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය යුත්තේ 2002.01.01 දින සිට බලපාන පරිදි **දීප ව්‍යාප්ත සේවා සම්බන්ධයෙන්** පමණි.

03. ඉහත 01 ඡේදය යටතේ දක්වා ඇති ස්ථාන මාරු ප්‍රතිපත්තිය 2002.01.01 දින සිට ක්‍රියාත්මක කරන ලෙස දැනට දීප ව්‍යාප්ත සේවාවන් පරිපාලනය කරනු ලබන එක් එක් මණ්ඩලවලින් සහ අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිමි.

එම්.එන්.ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය